www.AlevelApi.com

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ඉස්ලාම් II
இஸ்லாம் II
Islam II

44 S II

2019.08.06 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්:

※ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

I කොටස

1. (i) 'තක්වා' යනු කුමක් ද? (ලකුණු 02යි.)

 (ii) තක්වාහි වැදගත්කම පිළිබඳව අල්-කුර්ආන් සහ සුන්නාහි සඳහන් සාක්ෂි **එක** බැගින් ඉදිරිපත් කොට ඒවා විස්තර කරන්න. (ලකුණු 04යි.)

 (iii) දෛනික ජීවිතයේ දී තක්වා අනුගමනය කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන **හතරක්** සඳහන් කර ඒවායින් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 06යි.)

 (iv) මුස්ලිම්වරයෙකුගේ ජීවිතයේ ආධ්‍යාත්මික දියුණුවට බාධාවන කරුණු **හතරක්** සඳහන් කර ඒවායින් **දෙකක්** එදිනෙදා ජීවිතයේ දී වළක්වා ගන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 08යි.)

2. (i) 'යව්මුල් ආඛිරා' යනු කුමක් ද? (ලකුණු 02යි.)

 (ii) ඉස්ලාමීය දෘෂ්ටිකෝණයට අනුව ලෝක විනාශය සඳහා වූ සංකේත **හතරක්** ඉදිරිපත් කර ඒවායින් **දෙකක්** පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04යි.)

 (iii) මතු ලෝකය ගැන විශ්වාසය මුස්ලිම්වරයෙකුගේ ජීවිතයට ඇති කරන බලපෑම් **හයක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 06යි.)

 (iv) 'කලා කද්ර්' පිළිබඳ විශ්වාසය මිනිස් ජීවිතය හැඩගස්වා ගැනීමට උපකාරී වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 08යි.)

3. (i) 'ෆර්ලු අයින්' සහ 'ෆර්ලු කිෆායා' පද අර්ථ දක්වන්න. (ලකුණු 02යි.)

 (ii) සලාතය හා උපවාසය යන ඒවායේ අරමුණු **එක** බැගින් සඳහන් කර ඒවා විස්තර කරන්න. (ලකුණු 04යි.)

 (iii) මිනිස් ජීවිතයේ දී සියලු ක්‍රියාවන් ඉබාදත් ලෙස පිහිටුවීමට අවශ්‍ය කොන්දේසි අතුරෙන් **හතරක්** සඳහන් කොට එයින් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)

 (iv) සකාත් සාමූහික කටයුත්තක් ලෙස ඉටු කිරීමට අවශ්‍ය කරුණු **හතරක්** ඉදිරිපත් කරන්න. ඒ අතුරෙන් **දෙකක්** ප්‍රායෝගික ජීවිතයට සම්බන්ධ කොට පැහැදිලි කරන්න. (ලකුණු 08යි.)

[දෙවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

II කොටස

4. (i) ඉස්ලාම් ආර්ථිකයේ ප්‍රායෝගික අංග **පහක්** ඉදිරිපත් කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

(ii) ඉස්ලාමික බැංකු ක්‍රමයෙහි ව්‍යුහය පෙන්වා දී එහි පදනම පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

5. (i) 'ඉස්ලාම් නීති ක්ෂේත්‍රයේ මතවාද ඇති වීමට තුඩු දුන් කරුණු **පහක්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

(ii) 'ඉස්ලාම් නීති ක්ෂේත්‍රයෙහි 'ස්වර්ණමය යුගය' කුමක් ද? එම යුගයේ දී ෆික්හු කලාවේ වර්ධනය පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

6. (i) නිෂ්පාදනය හා පරිභෝජනය පිළිබඳව ඉස්ලාම් නීතිරීති හා රෙගුලාසි විවරණය කරන්න. (ලකුණු 10යි.)

(ii) පවුල් ජීවිතයේ දී මතුවන ගැටලු සඳහන් කොට ඒවාට ඉස්ලාමීහි ඇති විසඳුම් පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

7. (i) ඉමාම් තිර්මිදි (රහ්) තුමාගේ ජීවිත ඉතිහාසය සඳහන් කොට එතුමා හදීස් කලාවට සිදු කළ දායකත්වය පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

(ii) කවාරිජ් චින්තන කණ්ඩායමේ ප්‍රභවය සහ වර්ධනය පිළිබඳ විස්තර කොට එහි ප්‍රධාන සිද්ධාන්ත පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

8. පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) 'මස්ලහා මුර්සලා' (ලකුණු 05යි.)

(ii) ඉස්ලාම් සහ ආගමික සහජීවනය (ලකුණු 05යි.)

(iii) බෛතුල් මාල් (ලකුණු 05යි.)

(iv) ශ්‍රී ලංකාවේ නිදහසට මුස්ලිම්වරුන්ගේ දායකත්වය (ලකුණු 05යි.)

* * *

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .